# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1886/68 - 2014 නොවැම්බර් මස 01 වැනි සෙනසුරාදා - 2014.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ කරනු ලබන නිවේදනයයි**

මෑත අතීතයේදී ත්‍රස්තවාදී සටන්කාමී හෝ වෙනත් කණ්ඩායමක යම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් තැනැත්තන් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ බැවින් ද,

02. 2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වගන්තියට අනුව,

2.1 අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ හෝ අවතැන් වී සිටි තැනැත්තෙකු වූද,

2.2 2009 වර්ෂය අවසන්වන තෙක් වූ යම් වර්ෂයක් සඳහා උතුරු පළාතේ හෝ නැගෙනහිර පළාතේ යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ ඡන්ද හිමි නාමලේඛනයක නම ඇතුළත්වන්නා වූ ද,

2.3 2009 වර්ෂයෙන් පසුව වලංගුව පැවති කවර හෝ නාම ලේඛනයක තමාගේ නම ඇතුළත් කරනු ලැබ නොමැති වූද,

යන කරුණු නිශ්චිතව ඔප්පුකරනු ලැබීම මත සහ ඉල්ලුම්කරු අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවකු බව දැනට පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කිරීම මත, 2009 මැයි මස 18 දිනට පෙර තමා ස්ථිරව පදිංචිව සිටි මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාමලේඛනයේ නම ලියාපදිංචිකර ගැනීම සඳහා අදාළ මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉල්ලීමක් කිරීමට ඉහත කී පනතෙන් හිමිකම් ලබා දී ඇති බැවින් ද,

03. ඉහත සඳහන් විශේෂ විධිවිධාන පනතේ 3 වන වගන්තියට අනුව ඉහත 2 ඡේදයේ සඳහන් ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ දරුවන් වූ,

3.1 අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ දිනයේදී වයස අවුරුදු දහ අටට එළඹ නොසිටියා වූද, ඉල්ලීම කරනු ලබන අවස්ථාවේදී වලංගුව පැවති ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ දිනයේදී වයස අවුරුදු දහ අට හෝ ඊට වැඩි වයසකට එළඹ ඇත්තා වූ ද,

3.2 එම පුරවැසියා අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවකු බවට පත්වීමෙන් පසුව ඉපදී ඉල්ලීම කරනු ලබන අවස්ථාවේදී වලංගුව පැවති ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ දිනයේදී වයස අවුරුදු දහ අට හෝ ඊට වැඩි වයසකට එළඹ ඇත්තා වූ ද,

3.3 2009 වර්ෂයෙන් පසුව වලංගුව පැවති කවර හෝ නාම ලේඛනයක තමාගේ නම ඇතුළත් කරනු ලැබ නොමැති වූද,

1A - G 20520 — 30 (2014/10)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තැනැත්තන්ට උප්පැන්න සහතිකය සහ ග්‍රාම නිලධාරී විසින් ඉහත සඳහන් කරුණු සනාථ කරමින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කිරීම මත 2009 මැයි මස 18 දිනට පෙර තමා/තම දෙමව්පියන් අවතැන්වූවකු බවට පත්වීමට පෙර ස්ථිරව පදිංචිව සිටි මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට හිමිකම් ලබා දී ඇති බැවින් ද,

04. 2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඉහත 02 සහ 03 ඡේදවල සඳහන් සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගේ නම් ඇතුළත් කොට 2014 වර්ෂය සඳහා උතුරු හා නැගෙනහිර පළාත් වෙනුවෙන් පරිපූරක ඡන්ද හිමි නාමලේඛනයක් සකස් කිරීම සඳහා ඉල්ලුම්පත් භාර ගැනීම 2014 නොවැම්බර් මස 01 වැනි දින ආරම්භ කොට 2014 නොවැම්බර් මස 07 දින අවසන් කරන බවත් අදාළ ඉල්ලුම්පත්‍ර දිවයිනේ සියළුම මැතිවරණ කොට්ඨාස වල ලියාපදිංචි කිරීමේ නිලධාරී කාර්යාල වලින් ලබා ගත හැකි බවත් නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් උතුරු හා නැගෙනහිර පළාත් වල පිහිටි මැතිවරණ කොට්ඨාස වල (යාපනය, වන්නි, මඩකලපුව, දිගාමඩුල්ල හා ත්‍රිකුණාමලය) ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත ඉදිරිපත් කරන ලෙසත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

05. 04 ඡේදයේ සඳහන් පරිපූරක ලැයිස්තුව සකස් කිරීම 2014 නොවැම්බර් 07 දින අවසන් කර ඒ පිළිබඳ නිවේදනය 2014 නොවැම්බර් 08 වැනි දින නිකුත් කිරීමට අපේක්ෂිත බවත් එම ලැයිස්තුවට නම් ඇතුළත් නොවූ ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන්ට ස්වකීය නම් පරිපූරක ලැයිස්තුවට ඇතුළත් කර ගැනීම සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමට එදින සිට දින 07 ක අමතර කාලසීමාවක් ලබා දීමට අපේක්ෂිත බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2014ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
රාජගිරිය, සරණ මාවත,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

11 - 417

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.